INFORMATION SYSTEMS (Part - II)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

තොරතුරු පද්ධතියක්

ව්‍යාපාරයක තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය වන තොරතුරු රැස් කිරීම, සැකසීම, ගබඩා කිරීම, හා බෙදා හැරීම සඳහා වු අන්තර් සම්බන්ධතාවකින් යුත් උපාංග සමුහයක එකතුවක් තොරතුරු පද්ධතියක් ලෙස හැඳින්වේ.

තොරතුරු පද්ධතියක් මඟින් දත්ත තොරතුරු බවට පත් කෙරේ. මෙය ක්‍රියාවලියකි.

ClassWork.LK

දත්ත තොරතුරු බවට පත් කිරීමේ උපාංග

- **ආදානය (Input)**

තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම ආදානය යන්නෙන් අදහස් වේ.

- **සැකසීම (Processing)**

එකතු කරන ලද දත්ත තොරතුරක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය යි.

- **ප්‍රතිදානය (Output)**

දත්ත සැකසුම් ක්‍රියාවලිය මගින් සකසන ලද තොරතුරු අවශ්‍ය, අදාළ පාර්ශ්වයන්ට ලබා දීම ප්‍රතිදානය යි.

- **ගබඩා කිරීම (Storing)**

පද්ධතිය ජනිත කළ තොරතුරු පසු ව ප්‍රයෝජනයට ගැනීම සඳහා ආරක්ෂිත ව ගබඩා කර තබා ගැනීම යි.

- **ප්‍රතිපෝෂණය (Feed Back)**

අදාළ පාර්ශ්වයන්ට ප්‍රතිදාන යොමු කිරීම මගින් ආදාන ඇගැයීම හෝ අදහස් විමසීම හෝ ප්‍රතිපෝෂණය යි.

ClassWork.LK

තොරතුරු පද්ධතියක කාර්ය රූප සටහනක් මඟින්



ClassWork.LK

නිද :



ClassWork.LK

පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක් සමන්විත වන උපාංග

1. දෘඩාංග (Haedware)

තොරතුරු පද්ධතියක පවතින සියලු ම භෞතික කොටස් දෘඩාංග වේ.

නිද : යතුරු පුවරුව, මොනිටරය, මුද්‍රණ යන්ත්‍රය, මධ්‍ය සැකසුම් ඒකක (CPU)

2. මෘදුකාංග (Software)

දත්ත සැකසීම සඳහා වන පරිගණක වැඩසටහන් මෘදුකාංග වේ.

නිද : MS word, MS Excel, Windows

ClassWork.LK

3. ජීවාංග (Liveware)

තොරතුරු පද්ධතිය භාවිත කරන්නෝ හෙවත් පරිශීලකයෝ

නිද : පරිගණක ඉංජිනේරුවරු, පරිගණක වැඩසටහන් කරුවෝ, දතත් සැකසුම් කරුවෝ, ATM කාඩ්පත් භාවිතයෙන් සේවා ලබා ගන්නා පුද්ගලයෝ

4. දත්ත (Data)

තොරතුරු පද්ධතියට ලබා දෙන මූලික කරුණු හා සංඛ්‍යා දත්ත මින් අදහස් වේ.

5. ක්‍රියාපටිපාටි (Procedures&)

තොරතුරු පද්ධතියේ කාර්ය හා උපාංග පාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති සම්මුති, නීති රීති හා ප්‍රතිපත්ති ක්‍රියාපරිපාටි නමින් හැඳින්වේ.

ClassWork.LK

6. ස්ථිරාංග (Firmware)

උපාංග තුළ ඇති කයසවහි ස්ථිර ලෙස ගබඩා කර ඇති පරිගණක වැඩසටහන මින් අදහස් වේ. මේවා විද්‍යුතය නොමැති වුව ද අඛණ්ඩව පවතී.

නිදසුන් : (Microchip, IC)

<u>තොරතුරු පද්ධතියක අවශ්‍යතා හා වැදගත්කම</u>

- කළමනාකරිත්වයට අදාළ තීරණ ගැනීම සඳහා.
- සංවිධානයේ පරමාර්ථ හා අරමුණු සාක්ෂත් කර ගැනීම සඳහා.
- ව්‍යාපාරයේ දෛනික කාර්ය සාර්ථක ව හා නිවැරදිව ඉටු කර ගැනීම සඳහා.

ClassWork.LK

- ආයතනයේ ඵලදායීතාව ඉහළ නංවාලීම සඳහා.

- සම්පත් නාස්තිය අවම කරලීම සඳහා.

- මෙහෙයුම් කටයුතු අඛණ්ඩ ව සිදු කර ගෙන යාම සඳහා.

- වැරදි අවම කර ගැනීම හා ගබඩා ඉඩකඩ අවම කර ගැනීම සඳහා

ClassWork.LK

ඵලදායී තොරතුරු පද්ධතියක් මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යභාරය

- අදාළ පාර්ශ්වයන්ට නිවැරදිව තොරතුරු සන්නිවේදනය කිරිම
- නිෂ්පාදිත ගුණාත්වය ඉහළ නංවාලීමට සහාය වීම.
- ආයතනයේ පිරිවැය අවම කිරිම සඳහා සහාය වීම.
- තරගකාරිත්වයට සාර්ථකව මුහුණ දීමේ වාතාවරණයක් සැලසීම.
- කළමනාකරණ කාර්යයන්හි සාර්ථකභාවය තහවුරු කිරීම.
- අවශ්‍ය කවර හෝ අවස්ථාවක දී අවශ්‍ය පාර්ශ්වයන්ට අදාළ තොරතුරු ලබා දීම.

Class Work LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura